අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
MINISTRY OF EDUCATION

# නිරිතදිග මෝසම් වර්ෂා සමයේ ළමයින්ගේ ආරක්ෂාව සඳහා පියවර

ශ්‍රී ලංකාවේ නිරිතදිග මෝසම් වර්ෂාව තව නොබෝ දිනකින් වඩාත් සක්‍රීය විය හැකිය. එම වර්ෂාව සමග ඇතිවිය හැකි, ගංවතුර, තද සුළං, අකුණු, හා නායයාම් පිළිබඳව අවධානය දී සූදානම්ව සිටීම වැදගත් ය.

මෙම කාලයේ දී ළමයින්, ඔවුන්ගේ නිවාස හා වටපිටාව මෙන්ම පාසල්වල ආරක්ෂාව සඳහා පහත සඳහන් කරුණු ගැන අවධානය යොදමු. මෙහිදී, දැනට ඇති වී තිබෙන COVID-19 වසංගත තත්ත්වය පිළිබඳව විශේෂයෙන් සැලකිලිමත් වෙමු.

## නිවසේදී

- තම නිවස කඳු සහිත ප්‍රදේශයක පිහිටා තිබේනම්, නායයන අවදානමක් සහිත/රහිත බව ආපදා කළමනාකරණ දිස්ත්‍රික් කාර්යාලය හරහා දැනුවත් වෙන්න.
- නිවස හදිසි ගංවතුර, හෝ නායයාම් තත්ත්වයකට ලක්වේ යයි අනුමාන කළහැකි ප්‍රදේශයක පිහිටා ඇත්නම්, කල් ඇතුව තමන්ගේ නිවසේ බඩු-බාහිරාදිය ඉවත් කිරීමට හෝ ආරක්ෂිතව තැන්පත් කිරීමට පියවර ගන්න. මෙය තනිව හෝ ප්‍රජාවේ සාමූහික දායකත්වයෙන් කල හැකිය.
- ආපදා තත්ත්ව සහ කාලගුණික තොරතුරු අනතුරු ඇඟවීම් පිළිබඳ ඒ හා සම්බන්ධ ආයතන (කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, ජාතික ගොඩනැගිලි පර්යේෂණායතනය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව) ඉදිරිපත් කරන තොරතුරු වාර්තා සම්බන්ධයෙන් අවධානයෙන් සිටීම හා අදාළ ආයතනවලින් නිවැරදි තොරතුරු ලබා ගැනීමට කටයුතු කරන්න. මෙම තොරතුරු, වාර්තා සුදුසු පරිදි ළමයින්ගේද අවධානයට යොමු කරවිය හැකිය.

> ගංවතුර ඇතිවන පහත් බිම්වල, වර්ෂාව නිතරම පවතින කාලවල, දිනකදී මිලිමීටර 100 ඉක්මවන වර්ෂාවන් සහ ගංවතුර තත්ත්වයන් ඇතිකළ හැක.
>
> නායයාම් ඇතිවිය හැකි බෑවුම්වල , වර්ෂාව නිතරම පවතින කාලවල, දිනකදී මිලිමීටර 100 ඉක්මවන වර්ෂාවන් සහ නායයාම් ඇතිකළ හැක. වර්ෂාව මිලිමීටර 150 ඉක්මවන්නේ නම් අධික අවදානමක් පවතියි.

- හදිසි අවස්ථාවක් ඇති වුණොත් කටයුතු කරන ආකාරය, පවුලේ සාමාජිකයන් අතර සාකච්ඡා කර සැලසුමක් සාදාගන්න. වගකීම් බෙදා ගන්න. ළමයින්ටද හදිසි අවස්ථාවලට සූදානම්ව ප්‍රතිචාර දැක්විය හැකිය. ඔවුන්ටද ගැලපෙන වගකීම් පවරන්න.
- කානු, පීලි ආදිය පවිත්‍ර කරන්න. ජලයේ පාවී ගොස් වෙන තැන්වල රැඳී තිබිය හැකි අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභා කසල ඉවත්කරන ක්‍රම ඔස්සේ ඉවත් කරන්න, නැතහොත් වළලා දමන්න හෝ ආරක්ෂිතව පුළුස්සා දමන්න.
- ජලයට මිශ්‍ර විය හැකි කෘමි/වල් නාශක, බෙහෙත්, වෙනත් රසායන ද්‍රව්‍ය ආදිය ආරක්ෂිතව ගබඩා කරන්න / නැතිනම් ආරක්ෂා සහිත ස්ථානයකට රැගෙන යාමට කටයුතු කරන්න.
- අනාරක්ෂිත ළිං හෝ වලවල් වටා ආරක්‍ෂිත වැටක් යොදන්න. නැත්නම් ජලයෙන් යටවුවද ඉහලට පෙනෙන සේ සළකුණක් යොදන්න.
- සුළඟකින් කඩා වැටිය හැකි අන්තරායකාරී ගස් / අතු / අනාරක්ෂිත තාවකාලික ව්‍යුහයන් ඉවත් කරන්න.
- ආරක්ෂිතව ළඟා විය හැකි සුරක්ෂිත ස්ථාන පිළිබඳව දැනුවත් ව සිටීම. මෙහිදී පවතින COVID-19 වසංගත තත්ත්වය හේතුවෙන් අවම පරතරය තබා ගෙන සුරක්ෂිතව රැඳී සිටිය හැකි ස්ථාන පිළිබඳව අවධානය යොමු කරන්න.
- හදිසි අවස්ථා කට්ටලය / බෑගය (වඩාත්ම වැදගත් ලියකියවිලි, බැටරි සහ විදුලි පන්දමක්, ප්‍රථමාධාර කට්ටලයක් සහ රෝගීන් සඳහා බෙහෙත්, වතුර බෝතල්, බැටරි වලින් ක්‍රියාත්මක වන රේඩියෝවක්, කුඩා පිහියක්, කෙටි ආහාර පැකට්, මුහුණු ආවරණ සහ අනිකුත් සෞඛ්‍යාරක්ෂිත ද්‍රව්‍ය , සනීපාරක්ෂක තුවා, සහ රෙදි කිහිපයක්) පිළියෙළ කරගන්න.

- පුළුවන් උපරිමයෙන්, දරුවන්ගේ පොත් පත් ආරක්ෂා කරගන්න. ඒවා පොලිතින් / ප්ලාස්ටික් වලින් ආවරණය කර උස්/ආරක්ෂිත ස්ථානයක තබා ගන්න. පොත් තෙමී ඇත්නම් ඒවා සම්පූර්ණයෙන්ම වියළී යන තෙක් පිටු හැරවීම සිදු නොකරන්න. සෘජු හිරු එළිය නොවැටෙන තැනක වියළි වාතය ගලා යාමට ඉඩ දී වියළන්න.
- විදුලි බිඳවැටීම් වලට සූදානම් වන්න. භූමිතෙල් ලාම්පු, විදුලි කෝෂ සහිත විදුලි පන්දම්, හෝ ඉටිපන්දම් ද ගිනිපෙට්ටි ද සූදානම් කරගන්න.
- **අකුණු පවතින විට** එළිමහනේ, ජලාශ අසල, හෝ වැස්සෙන් නොතෙමෙන්න ගස් යට රැඳී නොසිටින්න. ජංගම දුරකථන භාවිත නොකරන්න.

**යම් පොදු ස්ථානයකට රැස්වී තාවකාලික නවාතැන් ගැනීමට සිදුවන අවස්ථාවකදී**

- හදිසි අවස්ථා කට්ටලය රැගෙන යන්න
- සෞඛ්‍ය පිළිවෙත් මැනවින් පිළිපදින්න. මුහුණු ආවරණ හැකි සෑම විටම පළඳින්න. පොදු ස්ථාන වලට යනවිට හා ඉන් පිට වූ විට හෝ පොදු දේ පරිහරණය කිරීමට පෙර හා පසු සබන්/sanitizer යොදා දෑත් හොඳින් සෝදා ගන්න.
- තමන් සහ පවුලේ පිරිස පරිහරණය කරන භාණ්ඩ ද්‍රව්‍ය වෙනත් කිසිම කෙනෙකු සමග නොගැටෙන සේ තබන්න.
- වැසිකිලි, ජල කරාම හා පොදු ස්ථාන ආදිය ට හානි නොපැමිණෙන ලෙස පරිහරණය කිරීමට වග බලා ගත යුතු ය.

**පාසලේදී නම්**

- ගංවතුර, නාය, තද සුළං, හා අකුණු සම්බන්ධයෙන් ඉහත ආරක්ෂක විධි අනුගමනය කරන්න
- පාසල් ගොඩනැගිලි වලට ගංවතුර අවධානම ඇත්නම්, පාසල් නොපැවත්වුවද, ගබඩාකර ඇති පොත්-පත්, ලිපි ලේඛන, පරිඝනක, ක්‍රීඩා/සංගීත හා ඉගෙනුම් උපකරණ ආරක්ෂිත/ ඉහල ස්ථානයක ගබඩා කරන්න. (සැ යු. පසුගිය ගංවතුර තත්ත්වවල දී බොහොමයක් පාසල් උපකරණ හා භාණ්ඩ කලින් සැලසුම් කලේ නම් බේරා ගත හැකිව තිබුණි).
- පාසල් පවත්වන්නේ නම්, සිසුන් අතර දුරස්ථ භාවය හැකිතරම් පවත්වා ගන්න. වර්ෂා අවස්ථාවලදී එක කුඩේ යටින් කීපදෙනෙකු ගමන් කිරීම, වර්ෂාවෙන් බේරීමට කුඩා වපසරියක කණ්ඩායමක් රැස්වීම, පිසදැමීමට පොදු ලේන්සු/තුවා භාවිතය, සෑම විටම මග හරින්න.
- පාසල් පූර්ව ආපදා සැලැස්ම සක්‍රීය කරන්න. මේ සඳහා ආපදා කළමනාකරණ නිලධාරීන් හා අනෙකුත් ආධාරක ආයතන වල සහාය ලබා ගන්න.

වැඩි විස්තර ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය හෝ දිස්ත්‍රික් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයෙන් ලබා ගන්න

දුරකථන 0773 957 900, 011-2136136 හෝ 011-2136222.

විද්‍යුත් තැපැල් ලිපින : eoc@dmc.gov.lk / eocdmc@gmail.com

## නිසි අවධානයෙන් ක්‍රියාත්මක වී අවදානම වළක්වා ගනිමු

අධ්‍යාපන අමාත්‍යාංශය
විෂය සමගාමී, මාර්ගෝපදේශ, උපදේශන ශාඛාව
0112 785 866